# මාසික
# විවරණිකාව

**2009 අගෝස්තු**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

# විවරණිකාව

## 59 වැනි වෙළුම  08 වැනි කලාපය

## 2009 අගෝස්තු

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

පටුන පිටුව


1 වන කොටස - මාසික සිදුවීම් - 2009 අගෝස්තු ..... 05

2 වන කොටස - පුවත්පත් නිවේදන - 2009 අගෝස්තු ..... 06

1. උද්ධමනය 2009 ජූලි මාසයේදීත් පහළ මට්ටමක ..... 06
2. මාස හතරක් තුළ දළ නිල සංචිත කැපී පෙනෙන ලෙස වර්ධනය වේ. 07
3. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කිරීම. 07 - 08
4. රජය විසින් එ.ජ.ඩොලර් මිලියන 190 ක ශ්‍රී ලංකා බැඳුම්කර හය මාසයක ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ පාදකාංක 450 ක් වූ පොලී අනුපාතිකයකට නිකුත් කරයි. ..... 08
5. 2009 ජුනි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය ..... 09 - 11
6. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 අගෝස්තු ..... 12
7. ශ්‍රී ලංකාව එ.ජ.ඩොලර් බිලියන 3.9 ක ඉහළම දළ නිල සංචිත ප්‍රමාණය වාර්තා කරයි. ..... 13
8. 2009 මැයි මාසයේ දී ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් අයතනය විසින් ක්ෂණිකව පහත හෙලන ලද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව රාජ්‍ය ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ ඉදිරි අපේක්ෂා සංශෝධනය කරන ලදී. ..... 13
9. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2007, 2008 සහ 2009 ..... 14

# 1 වන කොටස
# මාසික සිදුවීම්
# 2009 අගෝස්තු

## රාජ්‍ය මූල්‍ය අංශය

- ඇඟට ඇළුණු යටිකය ආවරණ ඇඳුම්, මේස් වර්ග හා පා ආවරණ ඇතුලත් ඇතැම් ඇඟළුම් සඳහා අදාළ වන සෙස් බදු අනුපාතය සියයට 25 හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 60 සිට සියයට 25 හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 625 යන දෙකෙන් වැඩි අගය දක්වා ඉහළ දමන ලදී.
- ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනයේ දී භාවිතා කිරීමට පමණක් ආනයනය කරනු ලබන යම් ද්‍රව්‍යයක් සහ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන ඖෂධ ඇසිරීම සඳහා භාවිතා කරනු ලබන දේශීයව නිෂ්පාදනය නොකරන යම් ඇසුරුම් ද්‍රව්‍යයක්, එම ඖෂධ නිෂ්පාදකයා විසින් ආනයනය කරනු ලබන අවස්ථාවක දී ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
- කල්බදු ක්‍රමය යටතේ හෝ අත්පිට මිලට ගැනීම මගින් ශ්‍රී ලංකාවට ගෙන්වනු ලබන නැවක් හෝ ගුවන් යානාවක් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

## චීන අපනයන - ආනයන බැංකුවෙන් ලැබුණු ණය ආධාර

1. කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ A1, A2, A3 සහ A4 යන අංශ හතර මූල්‍යනය කිරීම සඳහා පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 70.042 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 8,048), එ.ජ.ඩොලර් දශ ලක්ෂ 63.574 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 7,305), එ.ජ.ඩොලර් දශ ලක්ෂ 47.801 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 5,492) සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 66.783 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 7,673) ක ණය මුදල් හතරක් සඳහා ශ්‍රී ලංකා රජය සහ චීන අපනයන - ආනයන බැංකුව අතර ගිවිසුම් හතරකට 2009 අගෝස්තු මස 06 වැනි දින අත්සන් තබන ලදී. මෙම ණය මුදල් වසර තුනක සහන කාලයකට යටත්ව වසර 15 ක් ඇතුළත දී ගෙවා නිම කළ යුතු වේ. සෑම ණය මුදලක් සඳහාම පොලී වශයෙන් ණය මුදල මත වාර්ෂිකව සියයට 6.3 ක්, කළමනාකරණ ගාස්තු වශයෙන් ණය මුදල මත වාර්ෂිකව සියයට 0.3 ක් සහ අනිවාර්ය ගෙවීම් වශයෙන් දෛනිකව ණය මුදලේ ප්‍රයෝජනයට නොගත් කොටස මත වාර්ෂිකව සියයට 0.3 ක් ගෙවිය යුතුවේ.
2. නැව් සඳහා ඉන්ධන සැපයීමේ සහ ඉන්ධන ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් හම්බන්තොට ප්‍රදේශයේ පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 65.095 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 7,479) ක ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය සහ චීන අපනයන - ආනයන බැංකුව අතර ගිවිසුමකට 2009 අගෝස්තු මස 06 වැනි දින දී අත්සන් තබන ලදී. මෙම ණය මුදල වසර තුනක සහන කාලයකට යටත්ව වසර 15 ක් ඇතුළත දී ගෙවා නිම කළ යුතු වේ. මෙම ණය මුදල සඳහා පොලී වශයෙන් ණය මුදල මත වාර්ෂිකව සියයට 6.5 ක්, කළමනාකරණ ගාස්තු වශයෙන් ණය මුදල මත වාර්ෂිකව සියයට 0.3 ක් සහ අනිවාර්ය ගෙවීම් වශයෙන් දෛනිකව ණය මුදලේ ප්‍රයෝජනයට නොගත් කොටස මත වාර්ෂිකව සියයට 0.3 ක් ගෙවිය යුතු වේ.

## අන්තර්ජාතික සංවර්ධන සංගමයෙන් ලැබුණු ණය ආධාර


සෞඛ්‍යය අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යාධාර සැපයීමක් වශයෙන් වි.ගැ.හි. දශ ලක්ෂ 16.3 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 2,922) ක ණය මුදලක් සඳහා ශ්‍රී ලංකාව සහ අන්තර් ජාතික සංවර්ධන සංගමය අතර ගිවිසුමකට 2009 අගෝස්තු මස 14 වැනි දින අත්සන් තබන ලදී. මෙම ණය මුදල වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් ඇතුළත දී ගෙවා නිම කළ යුතු වේ. මෙම ණය මුදල පොලී අයකිරීම්වලින් නිදහස් අතර, මේ සඳහා සේවා ගාස්තු වශයෙන් ප්‍රයෝජනයට ගත් ණය මුදල මත වාර්ෂිකව සියයට 0.75 ක් සහ අනිවාර්ය ගෙවීම් වශයෙන් ප්‍රයෝජනයට නොගත් ණය මුදල මත සියයට 0.50 ක් ගෙවිය යුතුවේ.

## 2 වන කොටස
# පුවත්පත් නිවේදන
## 2009 අගෝස්තු

### 1. උද්ධමනය 2009 ජූලි මාසයේදීත් පහළ මට්ටමක

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) (2002 =100) ලක්ෂ්‍යමය වෙනස මත පදනම්ව මනිනු ලබන උද්ධමන අනුපාතය, 2009 ජූනි මාසයේ දී වසර පහක තුළ එහි අඩුම අගය වූ සියයට 0.9ට ළඟා වීමෙන් පසුව 2009 ජූලි මාසයේ දී සියයට 1.1ක පහළ අගයක් වාර්තා කළේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය 2008 නොවැම්බර් මාසයේ සිට අඛණ්ඩව අඩු වෙමින්, ජූනි මාසයේ පැවැති සියයට 12.5 සිට සියයට 10.4 දක්වා තවදුරටත් පහත වැටිණි.***

2008 ජූනි මාසයේ දී 207.8 ක් වූ කො.පා.මි.ද. 208.7 දක්වා ඉහළ ගිය අතර, පූර්ව මාසයට වඩා සියයට 0.4 ක සුළු වැඩිවීමක් එමගින් පෙන්නුම් කැරිණි. මාසික මිල දර්ශකයේ ඉහළ යෑම සඳහා සෞඛ්‍යය, ප්‍රවාහන සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන යන උප කාණ්ඩවල මිල ගණන් වැඩිවීම ආයක විය. විශේෂයෙන් ම පෞද්ගලික රෝහල් ගාස්තු හා විශේෂඥ වෛද්‍ය ගාස්තුවල ඉහළ යෑමක් වාර්තා විය. ඉන්ධන හා ගෑස් මිල ද ජූලි මස මුල් සතියේ සිට ඉහළ නැගිණි. කෙසේ වුවද, මෙම මිල ඉහළ යෑම් මගින් දර්ශකය මත ඇති වූ සමස්ත බලපෑම ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ගවල මිල පහත වැටීම හේතුවෙන් යම් දුරකට සමහන් විණි.




2009 ජූනි මාසයේ දී සියයට 7.7 ක් වූ ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමන අනුපාතය, 2009 ජූලි මාසයේ දී සියයට 6.0 දක්වා පහත වැටිණි. මාසික මූලික උද්ධමනය සියයට 1.1ක වර්ධනයක් පෙන්නුම් කළ අතර මූලික උද්ධමනයේ වාර්ෂික සාමාන්‍යය පූර්ව මාසයේ පැවැති සියයට 15.2 සිට 2009 ජූලි මාසයේ දී සියයට 14.2 දක්වා තවදුරටත් පහත වැටිණි.

## 2. මාස හතරක් තුළ දළ නිල සංචිත කැපී පෙනෙන ලෙස වර්ධනය වේ.

***2009 මාර්තු 31 දා වන විට වාර්තා වී තිබූ එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1,272 ක් වූ ශ්‍රී ලංකාවේ දළ නිල විදේශ සංචිත ප්‍රමාණය 2009 ජූලි 31 දා වන විට එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 2,180 ක් දක්වා සියයට 71 කින් වර්ධනය වී ඇති බව ඇස්තමේන්තුකර තිබේ.***

විදේශ සංචිත වර්තමාන මට්ටමට වැඩිවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් සම්පස්ථ ණය පහසුකමෙහි පළමු කොටස ලැබීම සහ ගත වූ මාස හතරක කාලය තුළ දේශීය වෙළෙඳපොළෙන් සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් රැස්කර ගැනීමට හැකිවීම ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම මත පදනම් ව 2009 සැප්තැම්බර් අවසානයට ළඟාකරගත හැකි යැයි අපේක්ෂා කළ මට්ටමටත් වැඩි විදේශ සංචිත ප්‍රමාණයක් මේ වන විට රැස්කරගෙන ඇති බව මේ ඇස්තමේන්තුවලින් පැහැදිළිවේ.

විශේෂයෙන්ම රට තුළ වර්ධනය වී ඇති දේශපාලන ස්ථාවරත්වය සහ දිනෙන් දින පුළුල් වන ආයෝජන අවස්ථා නිසා, විදේශයන්හි වසන ශ්‍රී ලාංකිකයන් ගෙන් සහ විදේශ ආයෝජකයන්ගෙන් නොකඩවා ලැබෙන විදේශ විනිමය නිසා ඉදිරි මාස වලදී රටේ විදේශ සංචිත තවදුරටත් වර්ධනය වනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

## 3. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කිරීම

***2005 අංක 28 දරණ ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනතෙහි නියෝග ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් 2009 ජූලි මස 30 දින සිට බලපැවැත්වෙන පරිදි 2009 අංක 01 දරණ ගෙවීම් කාඩ්පත් සැපයුම්කරුවන්ගේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.***

ගෙවීම් කාඩ්පත් සම්බන්ධ ගනුදෙනුවල නිරත සියලු සේවා සපයන්නන් අන්තර්ජාතික යහ ප්‍රමිතීන් සහ පරිචයන්ට අනුව කටයුතු කිරීම සහතික කිරීම මෙම නියෝගයන්ගේ ප්‍රධාන අරමුණ වේ. ගෙවීම් පද්ධතීන්හි නියාමක වශයෙන්, ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරය නියාමනය කිරීමට සහ හැසිරවීමට අවශ්‍යවන බලතල මේ මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත.

මෙම නියෝග අනුව සියළුම ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වීම අවශ්‍ය වේ. එයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව එවැනි සේවා සැපයුම්කරුවන් අධීක්ෂණය කිරීමේ අධිකාරිය ලෙස ක්‍රියාකරනු ලබන අතර ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන්හට නියෝග, විධාන, මාර්ගෝපදේශන, කොන්දේසි, චක්‍රලේඛන, රීති සහ උපදෙස් නිකුත් කිරීම සිදුකරනු ඇත.

මෙම නියෝග විශේෂයෙන් කාඩ්පත් පදනම් කරගත් ගෙවීම් සේවා සපයන්නන්ට සහ ගෙවීම් සේවා සපයන්නන්ට සහ එවැනි සේවාවන් භාවිතා කරන්නන්ට මෙන්ම සමස්ථයක් ලෙස ගත් විට මුළු ආර්ථිකයටම වාසි ගණනාවක් ඇතිකර දෙනු ඇතැයි බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සුපරීක්ෂණය තුළින් සේවා සැපයුම්කරුවන්ට ඇතිවිය හැකි පාඩු අවම වනු ඇති අතර ශ්‍රී ලාංකික පසුබිම තුළ ඉහළ මට්ටමේ අන්තර්ජාතික පරිචයන් අනුගමනය කිරීම තුළින් ඔවුන්ගේ ව්‍යාපාරවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් ඇතිවනු ඇත. ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන්ගේ නියාමක ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත්වීම මගින් මහජනතාවගේ විශ්වාසය මෙන්ම අවසන් පාරිභෝගිකයින්ට ලැබෙන සේවාවෙහි ආරක්ෂාවද වැඩිවනු ඇත. මීට අමතරව, සුරක්ෂිතවූත්, කාර්යක්ෂමවූත් සේවාවන් පවත්වාගත හැකිවන

පරිදි, ගෙවීම් කාඩ්පත් කර්මාන්තයට සම්බන්ධ සියලුම නව නිෂ්පාදන රටේ පවතින නියෝග යන්ට සහ ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලව සිදුකෙරෙන බව සහතික කිරීම සඳහා නව නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වාදීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒවා අධීක්ෂණය කරනු ඇත.

ගෙවීම් කාඩ්පත් මගින් ලැබෙන පාරිභෝගික පහසුව සහ ගනුදෙනුවල ආරක්ෂාව හේතුකොටගෙන එදිනෙදා ගනුදෙනු සඳහා එවැනි ගෙවීම් උපකරණ පිළිබඳව පාරිභෝගිකයන්ගේ කැමැත්ත වර්ධනය වී ඇති අතර, මේ නිසා මෑත කාලයේ දී ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ රාශිගත අගය සහිත කාඩ්පත් ආදී ගෙවීම් කාඩ්පත් සඳහා වැදගත් ස්ථානයක් ලැබී ඇත. එමෙන්ම උසස් සංන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් තම පාරිභෝගිකයින්ට වඩාත් පහසු සේවාවක් සැපයීම තුළින් සේවා සැපයුම්කරුවන් ද සිය ගෙවීම් කාඩ්පත් සඳහා වෙළෙඳපොළ සකස්කර ගැනීමට සමත් වී ඇත. ගෙවීම් සඳහා භාවිතා කරන චෙක්පත් වැනි අනෙකුත් ගෙවීම් උපකරණ සමඟ සැසඳීමේ දී කාඩ්පත් වලින් සිදුකරන ගනුදෙනු සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවැතිය ද එවැනි කාඩ්පත් ගෙවීම් උපකරණවල සීඝ්‍ර වර්ධනය සහ ආර්ථිකයට එයින් ලැබෙන ප්‍රතිලාභය සැලකිල්ලට ගනිමින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට සහ එවැනි ගෙවීම් කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් සුරක්ෂිතබව සහ කාර්යක්ෂමතාව පුළුල් වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ගෙවීම් කාඩ්පත් නියෝග සකස් කරන ලදී.

## 4. රජය විසින් එ.ජ.ඩොලර් මිලියන 190 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හය මාසයක ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ පාදකාංක 450 ක් වූ පොලී අනුපාතිකයකට නිකුත් කරයි.

***ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුදුසුකම් ලද ආයෝජකයින් සඳහා හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය සමඟ තරඟකාරී ලංසු තැබීම් තුළින් තීරණය වූ ආන්තික පොලී අනුපාතිකයන් යටතේ දායකත්වය සැපයීම පිණිස වසර 02 ක පරිණත කාලයකින් යුත්, එක්සත් ජනපද ඩොලර් මිලියන 150 ක වටිනාකමකින් යුත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඉදිරිපත් කරන ලදී.***

මෙම නිකුතුව 2009 අගෝස්තු 06 වැනි දින ආරම්භ කළ අතර 2009 අගෝස්තු 18 වන දින පියවන ලදී. නිකුත් කළ ප්‍රමාණය මෙන් 1.3 ක ගුණයක් වූ අධි දායකත්වයක් දක්වමින් දේශීය හා විදේශීය වාණිජ බැංකු වලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 195.5 ක වටිනාකමක් සහිත ලංසු ලැබී තිබුණි. මෙම ලංසු අතරින් වසර 2 ක පරිණත කාලයකින් යුත් එක්සත් ජනපද ඩොලර් මිලියන 190 ක ප්‍රමාණයක් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ වෙළෙඳපොළ මගින් තීරණය වූ පොලී අනුපාතිකයක් වූ පාදකාංක 449.8 (බර තැබූ සාමාන්‍ය ආන්තිකයක්) යටතේ පිළිගැනීමට රජය තීරණය කරන ලදී. අද දින එක්සත් ජනපද ඩොලර් සඳහා වන හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සියයට 0.91 ක් වේ.

මෙම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව 2009 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ණය ගැණුම් සීමාව තුළ පවතින අතර, මෙම නව බැඳුම්කර නිකුතුවෙන් ලබාගත් අරමුදල් පරිණත වන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර එක්සත් ජනපද ඩොලර් මිලියන 175 ක් වූ පියවීම් සඳහා භාවිතා කරනු ලැබේ.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිටසන් කර භාරදීමෙන් පසුව එය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී වෙත ලියාපදිංචි කිරීමෙන් පැවරීම සිදු කළ හැකිය. සුදුසුකම් ලත් ආයෝජකයින්ට ද්විතීයික වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරන ලද බලයලත් නියෝජිතයන්ගෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගත හැකිය.

## 5. 2009 ජූනි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය

***2009 ජූනි මාසයේදී අපනයන ආදායම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 565 ක් දක්වා ළඟා වූ අතර, ආනයන මත වියදම් ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 832 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 267 ක් දක්වා සියයට 50.5 ක පහත වැටීමක් වාර්තා කරන ලදී. 2009 පළමු භාගය තුළදී සමුච්චිත අපනයන ආදායම සහ ආනයන වියදම පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,189 ක් හා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,437 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2008 අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සමුච්චිත වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,249 ක් දක්වා සියයට 59.9 කින් පහත වැටුණි. 2008 පළමු භාගය තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,505 ක් වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2009 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,586 ක් දක්වා සියයට 5.4 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2009 පළමු භාගය තුළදී වාර්තා වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ හිඟයට වඩා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 337 ක (සියයට 27 ක පමණ) අතිරික්තයක් පෙන්නුම් කරයි.***

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2009 ජූනි මාසයේ දී අපනයන ආදායම සියයට 13.7 කින් පහත වැටුණි. කෙසේ වුවත්, අප්‍රේල් හා මැයි මාසවල සැලකිය යුතු ලෙස විශාල වශයෙන් පහළ ගිය අපනයන හා සැසඳීමේ දී ජූනි මාසයේ දී අපනයන පහත වැටීමේ වේගය අඩුවීමක් පෙන්නුම් කරනු ලබයි. මෙම පහත වැටීම සඳහා සියයට 73 ක ඉහළම දායකත්වයක් කාර්මික අංශයෙන් ලැබුණු අතර, කෘෂිකාර්මික අංශය ද මේ සඳහා හේතු විය. ගෝලීය ආර්ථික පසුබෑම හේතුවෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදන, රෙදිපිළි හා ඇඟළුම් සහ ඛනිජ තෙල් අපනයන අඩුවීම, 2009 ජූනි මාසයේ දී කාර්මික අපනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 420 ක් දක්වා සියයට 13.5 කින් පහත වැටීමට මූලිකවම හේතු විය. කෙසේ වුවත්, වසරේ ඉතිරි කාලපරිච්ඡේදය සඳහා ඇණවුම් ලැබීම යහපත් මට්ටමක් පෙන්නුම් කරන බැවින් දෙවන භාගයේදී ඇඟළුම් අපනයන යථා තත්ත්වයට පත්වනු ඇත. මෝටර් රථ, ඉදිකිරීම් සහ ප්‍රවාහන අංශයන්ගේ පසුබෑම හේතුවෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයන අඩුවීම, සමස්ත අපනයන අඩුවීමට ප්‍රධාන ලෙස බලපාන ලදී. තවද, 2009 ජූනි මාසයේ දී මුහුදු ආහාර, සත්ව ආහාර සහ අනෙකුත් ආහාර සැකසුම් අපනයන වැඩිවීම හේතුවෙන් ඉහළ ගිය ආහාර හා පානවර්ග අපනයන හැර අනෙකුත් සියලුම කාණ්ඩයන්ගේ අපනයන අඩුවිය. ප්‍රධාන වශයෙන් තේ අපනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 105 ක් දක්වා සියයට 10.8 කින් අඩුවීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 137 ක් දක්වා සියයට 15.2 කින් පහත වැටුණි. නිෂ්පාදනයේ පහත වැටීම, තේ අපනයන අඩුවීමට ප්‍රධානතම හේතුව විය. කෙසේ වුවත්, භාණ්ඩ මිල උත්පාත කාලයේ දී පැවැති මිල ගණන් වලට ආසන්න වූ ඉහළ මිලක් පැවතීම, සිලෝන් තේ සඳහා නොකඩවා පවතින ඉහළ ඉල්ලුමට සාක්ෂි දරයි. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2009 ජූනි මාසයේ දී රබර් සහ පොල් අපනයන ප්‍රමාණාත්මකව වැඩි විය. මැණික් අපනයන සියයට 14.8 කින් වැඩිවීම හේතුවෙන් ඛනිජමය අපනයන සියයට 8.6 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරන ලදී. 2009 පළමු භාගය තුළදී සමුච්චිත අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,189 ක් දක්වා සියයට 18.0 කින් පහත වැටුණි.

2009 ජූනි මාසය තුළදී ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 832 දක්වා සියයට 30.3 කින් පහත වැටුණි. ගෝලීය සැපයුම් අවහිරතාවයන් හමුවේ ජාත්‍යන්තර වශයෙන් සීනි මිල ගණන් ඉහළයාමේ නැඹුරුවක් පැවැතීම හේතුවෙන් සියයට 42.7 කින් ඉහළ ගිය සීනි ආනයන වියදම හැරුණු විට අනෙකුත් සියලුම උපකාණ්ඩයන්හි ආනයන වියදම් පහත වැටුණි. මෙම සමස්ත පහත වැටීම සඳහා ආයෝජන භාණ්ඩ ආනයනයන්හි සියයට 20 ක

දායකත්වය අභිබවමින් සියයට 64 ක ඉහළම දායකත්වයක් අන්තර්භාණ්ඩ ආනයනයන්ගෙන් ලැබුණි. ඛනිජ තෙල් ආනයන සඳහා වූ අඩු වියදම පිළිඹිබු කරමින් අන්තර් භාණ්ඩ ආනයන වියදම අන්තර් භාණ්ඩ ආනයන වියදම ජූනි මාසයේ දී තවදුරටත් පහත වැටුණි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2008 වසරේ පළමු භාගය තුළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,825 ක් වූ ඛනිජ තෙල් ආනයන වියදම 2009 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 866 ක් දක්වා සියයට 52.6 කින් පහත වැටුණි. 2008 වසරේ පළමු භාගය තුළ එ.ජ.ඩොලර් 108 ක් වූ සාමාන්‍ය බොරතෙල් ආනයනික මිල 2009 අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් 53 ක් දක්වා පහත වැටුණි. 2009 ජූනි මාසයේ දී සියයට 46.2 කින් පහත වැටුණු පොහොර මිල, පොහොර ආනයන වියදම පහත වැටීමට හේතු විය. සියළුම ප්‍රධාන උප කාණ්ඩයන්ගේ පහත වැටීම් පිළිඹිබු කරමින් 2009 ජූනි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන පහත වැටුණි. 2009 පළමු භාගය තුළදී සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4,437 ක් දක්වා සියයට 36.7 කින් පහත වැටුණි.

2009 ජූනි මාසය අග වන විට, ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,737 ක් සහ 1,618 ක් ලෙස වාර්තා විය. දේශීය බැංකු ආයතන දෙකක තැන්පත් කර ඇති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 62 ක තැන්පතුව ද මෙහි ඇතුළත් වේ. පසුගිය මාස 12 තුළදී වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව (මසකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 953) මෙම සංචිත අගයන් පිළිවෙලින් මාස 1.8 ක සහ 1.7 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ. කෙසේ වුවත්, ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදමෙහි තියුණු අඩුවීමෙන්, දැනට පවත්නා සහ අපේක්ෂිත ආනයන මිල පහළ යාම හේතු කොටගෙන සැබෑ වශයෙන් ම මූල්‍යනය කළහැකි ආනයනික මාස ගණන මීට වඩා වැඩි වනු ඇත.

දශක තුනක් තිස්සේ පැවැති යුදමය වාතාවරණය අවසන් වීමත් සමඟ ඇති වු සුභවාදී දැක්ම විදේශ විනිමය ගලාඒම කෙරෙහි යහපත් ප්‍රතිචාර දක්වා ඇත. 2009 මැයි මාසයේ මැද භාගයේ සිට 2009 අගෝස්තු 10 වන දින වන විට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මගින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 270 ක ශුද්ධ විදේශ විනිමය ගලා ඒමක් සිදු විය. මේ අතරම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය අවශෝෂණය කරගනිමින් තම නිල සංචිත වඩාත් යහපත් මට්ටමක් කරා වර්ධනය කිරීමේ ක්‍රියාදාමයේ යෙදී සිටී. 2009 මාර්තු මස අවසානයේ සිට (2009 අගෝස්තු 10 දක්වා) එ.ජ.ඩොලර් දශ ලක්ෂ 890 ක් වෙළෙඳපොළෙන් අවශෝෂණය කරගන්නා ලදී. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම සඳහා අනුමැතිය ලැබීමෙන් පසුව එහි පළමු මුදාහැරීම යටතේ ශ්‍රී ලංකාවට ලැබුණු විශේෂ ගැණුම් හිමිකම් දශ ලක්ෂ 206.7 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 322 ක් පමණ) හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ සංචිත සැළකිය යුතු ලෙස ඉහළ ගියේය.

මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය - 2009 ජූනි සහ 2009 ජනවාරි - ජූනි

| අයිතමය | 2008 ජූනි එ.ජ.ඩො. දශ ලක්ෂ | 2009 ජූනි එ.ජ.ඩො. දශ ලක්ෂ | ජූනි වර්ධනය (සියයට) | 2008 ජන: සිට ජූනි එ.ජ.ඩො. දශ ලක්ෂ | 2009 ජන: සිට ජූනි එ.ජ.ඩො. දශ ලක්ෂ | ජන: සිට ජූනි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **654.6** | **565.2** | **-13.7** | **3,888.2** | **3,188.7** | **-18.0** |
| කෘෂිකාර්මික | 161.3 | 136.7 | -15.2 | 890.0 | 728.3 | -18.2 |
| මෙයින් තේ | 117.2 | 104.5 | -10.8 | 624.2 | 505.1 | -19.1 |
| කාර්මික | 485.3 | 419.7 | -13.5 | 2,932.7 | 2,422.4 | -17.4 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 262.8 | 246.3 | -6.3 | 1,602.9 | 1,536.9 | -4.1 |
| ඛනිජ ද්‍රව්‍ය | 8.1 | 8.8 | 8.6 | 65.4 | 38.0 | -42.0 |
| ආනයන | **1,194.1** | **832.3** | **-30.3** | **7,004.5** | **4,437.3** | **-36.7** |
| පාරිභෝගික භාණ්ඩ | 210.9 | 152.9 | -27.5 | 1,362.6 | 913.7 | -33.0 |
| අන්තර් භාණ්ඩ | 735.1 | 504.7 | -31.3 | 4,106.9 | 2,382.3 | -42.0 |
| මෙයින් ඛනිජ තෙල් | 374.9 | 230.4 | -38.6 | 1,824.9 | 866.0 | -52.6 |
| ආයෝජන භාණ්ඩ | 238.4 | 167.1 | -29.9 | 1,488.4 | 1,080.9 | -27.4 |
| වෙළෙඳ ශේෂය | **-539.5** | **-267.1** | **-50.5** | **-3,116.4** | **-1,248.6** | **-59.9** |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | **233.0** | **277.7** | **19.2** | **1,505.0** | **1, 586.3** | **5.4** |

මූලය :- ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## 6. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 අගෝස්තු

***ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගයන්ට ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහත බසිමින් පවතින නමුත් ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩුවීමට සාපේක්ෂව එම අනුපාතික තවදුරටත් අඩුවිය යුතුව ඇත***

වෙළෙඳපොළ පොලී අනුපාතික සඳහා පදනම් කර ගන්නා අනුපාතික ලෙස සැලකෙන භාණ්ඩාගාර බිල්පත් මත වන එළඳා අනුපාතික වසර තුළ මේ දක්වා පදනම් අංක 675-715 අතර පරාසයකින් අඩු වී ඇත. මේ අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පදනම් අංක 500-600 අතර පරාසයකින් අඩු වී ඇත. සෙසු වෙළෙඳපොළ පොලී අනුපාතික අතර, ජූලි මස වනවිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය පදනම් අංක 65 කින් පමණ අඩු වී තිබෙන අතර, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පදනම් අංක 415 කින් පමණ අඩු වී ඇත. නාමික සහ මූර්ත පදනම් මත පොලී අනුපාතිකයන්හි අඩුවීම සහ ව්‍යාපාරික විශ්වසනීයත්වය වර්ධනයවීම වසරේ ඉදිරි කාලය තුළ ආර්ථික ක්‍රියාකාරකම් දිරිගැන්වීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෑත මාසයන් තුළ විදේශ අංශයේ ස්ථායිතාවය වර්ධනය වීමත් සමග විනිමය අනුපාතිකයේ විචලනයන් සීමා කිරීමටත්, විදේශ සංචිත සැලකිය යුතු ආකාරයෙන් ගොඩ නැංවීමටත් ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වී ඇත. විදේශීය ආයෝජන, අපනයන ඉපැයීම් සහ පෞද්ගලික ප්‍රේෂණ ලැබීම් හමුවේ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් මිලදී ගත් ශුද්ධ විදේශ විනිමය ජූලි මස මුල් භාගයේ සිට අඛණ්ඩව ධන අගයක් ගෙන ඇත. 2009, අගෝස්තු 17 වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය වෙළෙඳපොළෙන් මිලදී ගත් ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 600 ඉක්මවා ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම යටතේ මුදාහැරුණු පළමු වාරිකයත් සමග දළ විදේශ සංචිත තවදුරටත් වර්ධනය වී ඇත. එම ලැබීම් ඉවත් කළ පසුව වුවද, 2009 වර්ෂයේ අගෝස්තු 17 වනවිට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 2.3 ඉක්මවා ඇත.

මහ බැංකුව විසින් පෙර සිටම ක්‍රියාත්මක කරන ලද ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ග මෙන්ම අන්තර්ජාතිකව භාණ්ඩ මිල මට්ටම් පහළ මට්ටමක පැවතීමෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයෙහි උද්ධමනාත්මක පීඩන පහත් මට්ටමක පවතී. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2002=100) ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය 2009 ජූනි මස දක්වා සියයට 0.9 දක්වා අඛණ්ඩව අඩු වූ අතර, ජූලි මාසයේදී සියයට 1.1 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

පසුගිය වසරේ තීව්‍ර ලෙස මිල ගණන් ඉහළ යාම සහ එය පදනම් වශයෙන් භාවිතා වීමේදී මෙම වසරේ ලක්ෂ්‍යමය උද්ධමනය අඩුවීමට පැවති බලපෑම ක්‍රමයෙන් පහව යාමත් සමග ලොව අන් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද උද්ධමනය 2009 වසරේ දෙවන භාගය තුළ මද වශයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. එසේ වුවද, වසරේ ඉදිරි කාලය තුළ ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය තනි අංකයක අගයක් ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම කරුණු සැළකිල්ලට ගෙන මුදල් මණ්ඩලය විසින් 2009 අගෝස්තු මස 17 වැනි දින පවත්වන ලද මුදල් මණ්ඩල රැස්වීමේදී මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීලඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2009 සැප්තැම්බර් මස 16 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

## 7. ශ්‍රී ලංකාව එ.ජ.ඩොලර් බිලියන 3.9 ක ඉහළම දළ නිල සංචිත ප්‍රමාණය වාර්තා කරයි.

***ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය 2009 අගෝස්තු මස 25 වැනි දින දී එ.ජ.ඩොලර් බිලියන 3.3 ඉක්ම වූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) මගින් අනුමත කරන ලද නව විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) වෙන් කිරීමත් සමග එය මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම වූ එ.ජ.ඩොලර් බිලියන 3.9 දක්වා වර්ධනය විය.***

2009 අගෝස්තු මස 07 වැනි දින, G-20 නායකයින්ගේ සහ ජා.මූ.අරමුදලේ ජාත්‍යන්තර මුදල් සහ මූල්‍ය කමිටුවේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් ජා.මූ. අරමුදලත් සමග ඇති කොටස මත පදනම්ව සියලුම සාමාජික රටවල් අතර එ.ජ.ඩොලර් බිලියන 250 කට සමාන සාමාන්‍ය වි.ගැ.හි. වෙන් කිරීමක්, 2009 අගෝස්තු මස 28 වැනි දින සිදු කිරීමට ජා.මූ.අරමුදලේ අධිපතිවරුන්ගේ මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. මෙවැනි නව වි.ගැ.හි. වෙන් කිරීමක් සිදු කිරීමේ මූලික අරමුණ වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය නිසා ඇතිවන ඕනෑම ද්‍රවශීලතා ගැටළුවකට මුහුණ දීම සඳහා සියලුම සාමාජික රටවල විදේශ සංචිත ශක්තිමත් කිරීම වේ. මෙම වි.ගැ.හි. වෙන් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත මට්ටම වි.ගැ.හි. දශ ලක්ෂ 307 (දළ වශයෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 475) කින් වර්ධනය විය.

ඒ අනුව, රටේ දළ නිල සංචිත (ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ඇතුළත් නොවූ) කලින් පැවැති ඉහළම මට්ටම වන එ.ජ. ඩොලර් දශ ලක්ෂ 3,558 ද ඉක්මවා එ.ජ.ඩොලර් බිලියන 3.9 දක්වා ළඟා වී ඇති අතර, එය දළ වශයෙන් ආනයනික මාස 4.2 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් වේ. යළි ගොඩනැගුණු ආයෝජකයින්ගේ විශ්වාසය තුළින් සහ අඛණ්ඩව විදේශ විනිමය ලැබීම් සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන්, ඉදිරි මාසවලදී ද රටේ විදේශ සංචිත තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 8. 2009 මැයි මාසයේ දී ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ආයතනය (Standard & Poor's) විසින් ක්ෂණිකව පහත හෙලන ලද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැක්ම සංශෝධනය කරන ලදී.

***2009 ජූලි මස 24 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අනුමත කරන ලද සම්පස්ථ ණය පහසුකම යටතේ රටෙහි විදේශ ද්‍රවශීලතා මට්ටම වර්ධනය වී තිබීම සහ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ යහපත් අපේක්ෂාවන් පිළිඹිබු කරමින් ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැක්ම සෘණ මට්ටමේ සිට ස්ථාවර මට්ටම දක්වා සංශෝධනය කර ඇත.***

2008 දෙසැම්බර් මස 15 වන දින ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැක්ම ස්ථාවර තත්ත්වයට පත් කළ අතර, විදේශ ද්‍රවශීලතා තත්ත්වය පිරිහීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම B+ ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා පහත හෙලන ලදී. කෙසේ වෙතත්, පසුව 2009 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ දැක්ම අත්තනෝමතික ලෙස සෘණ මට්ටමට වෙනස් කළ අතර, එම අත්තනෝමතික තීරණය ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ආයතනය විසින් ගනු ලැබුවේ වසර 26 ක් පැරණි අභ්‍යන්තර ගැටුම් අවසන් වී දින කිහිපයක් ගත වීමෙන් අනතුරුවය. ස්ටෑන්ඩර්ස් සහ පුවර්ස් ආයතනය මගින් ශ්‍රී ලංකාව පිළිබඳ දැක්ම අත්තනෝමතික ලෙස පහත දැමුවද, ශ්‍රී ලංකාවේ පැවැති සිවිල් යුද්ධය අවසන් වීමෙන් අනතුරුව විදේශීය ආයෝජකයින් දැක්වූ ධනාත්මක ප්‍රතිචාර හමුවේ ඔවුන් එම දැක්ම නොසලකා හැරි බව සනාථ වේ.

## 9. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2007, 2008 සහ 2009

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 |
| ජනවාරි | 151.8 | 183.5 | 203.1 | 1.3 | 3.0 | -0.3 | 13.7 | 20.8 | 10.7 | 10.6 | 16.4 | 21.6 |
| පෙබරවාරි | 155.2 | 188.6 | 202.9 | 2.2 | 2.8 | -0.1 | 15.2 | 21.6 | 7.6 | 11.1 | 17.0 | 20.3 |
| මාර්තු | 155.0 | 191.9 | 202.0 | -0.1 | 1.7 | -0.4 | 15.1 | 23.8 | 5.3 | 11.7 | 17.7 | 18.6 |
| අප්‍රේල් | 156.3 | 195.4 | 201.0 | 0.8 | 1.8 | -0.5 | 14.3 | 25.0 | 2.9 | 12.3 | 18.7 | 16.7 |
| මැයි | 157.3 | 198.5 | 205.1 | 0.6 | 1.6 | 2.0 | 13.2 | 26.2 | 3.3 | 12.6 | 19.8 | 14.7 |
| ජූනි | 160.6 | 205.9 | 207.8 | 2.1 | 3.7 | 1.3 | 13.5 | 28.2 | 0.9 | 12.8 | 21.0 | 12.5 |
| ජූලි | 163.1 | 206.4 | 208.7 | 1.6 | 0.2 | 0.4 | 15.4 | 26.6 | 1.1 | 13.3 | 21.9 | 10.4 |
| අගෝස්තු | 165.2 | 206.3 | 208.1 | 1.3 | 0.0 | -0.3 | 16.5 | 24.9 | 0.9 | 13.8 | 22.6 | 8.5 |
| සැප්තැම්බර් | 166.7 | 207.2 | | 0.9 | 0.4 | | 16.1 | 24.3 | | 14.2 | 23.2 | |
| ඔක්තෝබර් | 171.8 | 206.6 | | 3.0 | -0.3 | | 18.2 | 20.2 | | 14.8 | 23.4 | |
| නොවැම්බර් | 176.4 | 205.2 | | 2.7 | -0.7 | | 19.3 | 16.3 | | 15.4 | 23.0 | |
| දෙසැම්බර් | 178.1 | 203.7 | | 1.0 | -0.7 | | 18.8 | 14.4 | | 15.8 | 22.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව